

# ලෝකාලෝකය

2019 අගෝස්තු - නොවැම්බර් කලාපය

**ලෝකයෙහි නුඹලාට පීඩා තිබේ.**
**නමුත් ධෛර්යවත්වෙන්න;**
**මම ලෝකයෙන් ජයගතිමියි,**
**යේසුස්වහන්සේ කියනසේක.**
**(යොහාන් 16:33)**


ක්‍රිස්තියානි සහෝදර මධ්‍යස්ථානය
අංක - 07, විවේකානන්ද පාර, වැල්ලවත්ත, කොළඹ 06.
දුරකථන අංක : 011 2581901

ළමා පිටුව

# වැදගත්ම දේ

ආදරණීය දුවේ පුතේ, කාලය බොහෝ වේගයෙන් ගමන් කරනවා. අපි මේ වර්ෂයේ මැද භාගයේ අවසන් කොටසටත් ඇවිත්. පුංචි ඔයාලත් ඔයාලගේ දවස බොහෝ කාර්ය බහුලව නේද ගත කරන්නේ? අධ්‍යාපන වැඩ කටයුතු, ක්‍රීඩා සහ විෂය සමගාමී ක්‍රියාකාරකම් වල යෙදෙමින් දවසම ඔබ ඉතා වෙහෙසෙනවා නේද? දුවේ පුතේ, අධ්‍යාපනය වෙනුවෙන් වෙහෙසීම ඉතාමත් වටිනා කාරණයක් නමුත් වඩා වැදගත්ම දෙයනම් මේ සියලු වැඩ අතරේ ඔබේ දෙවිපියාණන් ගැන සිතීමට වේලාවක් වෙන්කර ගැනීමයි. එයට ඔයාගේ පිළිතුර "ඔව්" නම් ඒ ගැන දෙවිපියාණන්ට ස්තුති වේවා! "නැහැ" නම් ඔබ ඒ ගැන තව දුරටත් සිතා බැලිය යුතු වෙනවා.

දුවේ පුතේ ඔබ දිනපතාම ඔබේ වැඩ කටයුතු සඳහා වේලාවක් වෙන්කරගෙන තිබෙනවා නේද? පාසල් යෑමට, උපකාර පන්ති, වගේම රූපවාහිනිය නැරඹීමට හා සෙල්ලම් කිරීමටත් ඔබට වේලාවක් තිබෙනවා නේද? මේ සියල්ල හා කාලය අපට දුන් දෙවියන්වහන්සේ සමඟ ගත කිරීමට වේලාවක් ඔබේ කාල සටහනෙන් සොයා ගනිමු. එස්තර් කියන්නේ හොඳ ගැහැණු ළමයෙක්. එයාගේ පවුලේ එයයි, අම්මයි, තාත්තයි, මල්ලියි. අම්මයි, තාත්තයි හුඟක් මහන්සිවෙලා තමයි එස්තර්ට හා මල්ලිට අවශ්‍ය දේ අරගෙන දෙන්නේ. ලස්සන ඇඳුම්, පොත් පත්, ලස්සන සෙල්ලම් බඩු හා රස කෑම ජාති වලට එස්තර් හරිම ආසයි. එස්තර් ද හොඳට ඉගෙන ගත්තා. ඇය හොඳට පාඩම් කළා. ක්‍රීඩා කළා. ඒත්, යාච්ඤා කිරීමට ටිකක් කම්මැලියි. සමහර දවසට අම්මගේ කරදරයට පොඩ්ඩක් යාච්ඤා කළා. යාච්ඤා කරන වේලාවට ඇය වෙන වෙන වැඩ කළා. සමහර දවසට නිදිමතයි කියලා නිදාගත්තා.

කාලය මෙසෙල ගත වෙලා යන විට එස්තර්ගේ තාත්තා අසනීප වුණා.රැකියාවට යන්න බැරි වුණා. තාත්තව බලාගන්න අම්මටත් ගෙදර නවතින්න සිදුවුණා. දැන් එස්තර්ට ඇය කැමති ලස්සන දේවල් සහ රසම රස කෑම ජාති මිලට ගන්න බැරි වුණා. ඒ වෙනුවට ඇයට ලැබුනේ එතරම් ආකර්ශනයක් නැති දේවල්, එස්තර්ට හරිම දුකයි. ඇය කල්පනා කළා. මම කාටද කියන්නේ මගේ තාත්තව සනීප කරන්න කියලා. මට කැමති දේවල් අරගෙන දෙන්න කියලා. ඇය දණ නමා යාච්ඤා කරන්නට පටන් ගත්තා. ඇගේ සිතේ තියෙන හැමදේම උන්වහන්සේට කිව්වා. හැමදාම මේ විදිහට ඇය යාච්ඤා කළා. දෙවිපියාණන් ඇගේ යාච්ඤාව අසා ඇගේ යාච්ඤාවට පිළිතුරු දුන්න. ඇගේ පියා සුවය ලැබ රැකියාවට ගියා. දැන් ඇගේ පවුලේ නැවතත් සතුට ඉතිරෙන්න වුණා. එස්තර් තේරුම් ගත්තා යාච්ඤාවේ වටිනාකම. දැන් ඇයට ලස්සන ලස්සන දේවල් ඕන වුනේ නැහැ. ඒ වෙනුවට ඇය ඇගේ කාල සටහනේ යාච්ඤාවට වේලාවක් වෙන්කරගෙන හැමදාම යාච්ඤා කළා. දෙවිපියාණන්ද ඇය ගැන බොහෝ ප්‍රීති වී ඇගේ යාච්ඤාවන්ට පිළිතුරු දුන්නා.

දුවේ පුතේ, බයිබලයේ මෙසේ සඳහන් වෙනවා, **"නිතරම ප්‍රීතිවෙන්න, නොකඩවා යාච්ඤා කරන්න, සියල්ලේදී ස්තූති කරන්න" (1 තෙසලෝනික 5:16-17)**. පුංචි ඔබ නිතරම ප්‍රීතියෙන් නේද ඉන්නේ. එසේනම් දැන් නොකඩවා යාච්ඤා කරන්න. ඔබේ කාල සටහනෙත් වේලාවක් වෙන්කරන්න. ඔබ ගැන දෙවිපියාණන් බොහෝ ප්‍රීති වී ඔයාලාගේ යාච්ඤාවට පිළිතුරු ලබා දීමට බලා සිටිනවා.

යේසුපිහිටයි!

**මීට, ආදර,**
**ශෂිලා නැන්දා**

# කිතුණු පීඩාව හා පීඩාවෙන් ජය ගැනීම.

**ලෝකයෙහි නුඹලාට පීඩා තිබේ. නමුත් ධෛර්යවත් වෙයල්ලා, මම ලෝකයෙන් ජය ගතිමියි කීසේක (යොහාන් 16:33).**

කිතුණුවන්ට එල්ලවන පීඩාව පිළිබඳ විවිධාකාර අදහස් තිබේ. නමුත් කිතුණු පීඩා වසර 2000 වඩා කාලයක් පුරා පැවති බවට බයිබලය හා ඉතිහාසය සාක්ෂි දරයි. ක්‍රිස්තුස්වහන්සේ උපතේදී උන්වහන්සේ විනාශ කිරීමට එවකට සිටි රජතුමා උත්සාහ දැරීය. එතැන් පටන් අද දක්වා ලෝකයේ කොහේ හෝ කිතුණුවන්ට පීඩා කරදර කිරීම් වාර්තා වේ. නමුත් නොකඩවාම කිතුණුවන්ගේ ගණන වැඩි විය. සභාව දියුණු විය. බයිබල් මුද්‍රණය වැඩි විය. මෙය අභිරහසකි. දෙවියන්වහන්සේ ක්‍රියාකරන ආකාරය අපට මුලුමනින්ම තේරුම් ගැනීමට නොහැක. එබැවින් විශ්වාස කරමු.

- ★ **සභාවට, ඇදහිලිවන්තයන්ට පීඩා කිරීම යනු ස්වාමී වූ යේසුස්වහන්සේට පීඩා කිරීමකි. - (ක්‍රියා 9:3-5).**
- ★ **සභාවට, ඇදහිලිවන්තයන්ට පීඩා කිරීමේදී යේසුස්වහන්සේගේ ප්‍රතිචාරය - "සිංහාසනයෙන් නැගී සිටීම" - (ක්‍රියා 7:55-57).**
- ★ **සභාවට, ඇදහිලිවන්තයින්ට පීඩාව දෙවියන්වහන්සේ නොදැනුවත්ව සිදු නොවේ - (මතෙව් 10:29-31 / ලූක් 12:7).**

යම් කිතුණු කණ්ඩායමකට, පුද්ගලයකුට, හෝ සභාවක් ඉලක්ක කරගෙන සිදුකරන පීඩාවක් හෝ කරදරයක් වේ නම් එය දෙස දෙවියන්වහන්සේගේ දෘෂ්ඨිකෝණයෙන් බැලීමට කිතුණුවන් වන අප පුරුදු පුහුණු විය යුතුයි.

## දේවවචනයානුකූලව පීඩාවෙන් ජයගන්නේ කෙසේද?

### 01. දෙවියන්වහන්සේගේ ප්‍රේමය කරණකොටගෙන ජය ගැනීම. - (රෝම 8:37)

**"නමුත් අපට ප්‍රේමකළාවූ තැනැන්වහන්සේ කරණකොටගෙන අපි මේ සියල්ලේදී අතිශයින් ජය ගන්නෝ වෙමු"**

පරමාධිපත්‍ය වූ සර්වබලධාරී දෙවියන්වහන්සේ දැනටමත් අපට ප්‍රේමකොට අප දරුවන් බවට පත් කරගෙන ඇත. උන්වහන්සේ කෙරෙහි අදහන්නට ඇති එකම අව්‍යාජ ශක්තිමත් බලාපොරොත්තුව වන්නේ දේව ප්‍රේමයයි. එය නොවෙනස් වන්නාවූද, අල්පමාත්‍රයක්වත් අඩු-වැඩි නොවෙන්නාවූ ප්‍රේමයකි. කොන්දේසි විරහිත, අචල, ඒකාකාරව තිබෙන ප්‍රේමයකි. එම ප්‍රේමය විශ්වාස කිරීම හැර වෙන විකල්පයක් කිතුණුවන්ට නැත.

- ★ **දෙවියන්වහන්සේ සදාකාල ප්‍රේමයකින් අපට ප්‍රේම කළ සේක - (යෙරමියා 31:3).**
- ★ **දෙවියන්වහන්සේ තම ඒක ජාතක පුත්‍රයාණන් දෙන තරම් අපට ප්‍රේම කළ සේක - (යොහාන් 3:16).**

- ★ **යේසුස්වහන්සේ තම ජීවිතය දෙන තරම් අපට ප්‍රේම කළ සේක - (රෝම 5:8).**
- ★ **කිසිවෙකුට වෙන් කළ නොහැකි ප්‍රේමයකින් අපට දෙවියන්වහන්සේ ප්‍රේම කළ සේක - (රෝම 8:39).**
- ★ **යේසුස්වහන්සේ කිසිදා දැනගෙන ඉවර කළ නොහැකි ප්‍රේමයකින් ප්‍රේම කළ සේක - (එපීස 3:18).**
- ★ **දෙවියන්වහන්සේ අපට කොන්දේසි විරහිත ප්‍රේමයකින් ප්‍රේම කළ සේක - (රෝම 5:8 / රෝම 5:5).**
- ★ **දෙවියන්වහන්සේ මනින්න නොහැකි ප්‍රේමයකින් අපට ප්‍රේම කළ සේක - (එපීස 3:19).**

## 02 දෙවියන්වහන්සේ කෙරෙහි ඇදහිල්ල කරණකොට ගෙන ජය ගැනීම - (1 යොහාන් 5:4)

**"මක්නිසාද දෙවියන්වහන්සේගෙන් උපන් යමක් ඇද්ද එය ලෝකයෙන් ජයගන්නේය. ලෝකයෙන් ජයගෙන තිබෙන්නේ අපේ ඇදහිල්ලය".**

ලෝකයෙන් ජයගැනීම යනු, ලෝකාකාර හා ලෞකික පැවැත්මෙන් හා එහි රටාවෙන් බේරී සිටීමයි. සියලු වෛරය, දුෂ්ඨකම, පීඩාවන් ලෝකාකාර දේවල්ය. එයින් ජයගැනීමට දෙවියන්වහන්සේ කෙරෙහි තදබල ඇදහිල්ලක් අවශ්‍යය. කිතුණුවන්ගේ පරමාදර්ශී චරිතය වන යේසුස්වහන්සේ ද අප වාගේම පීඩාවන් හා පරීක්ෂාවන්ට මුහුණ දුන් නමුත් තම ධර්මිෂ්ඨ පියාණන් කෙරෙහි හැම විටම ඇදහිල්ල තැබුවේය. ත්‍රස්තවාදයද ලෝක බල අරගලයේ තවත් පැතිකඩක්ය. එහි පීඩාව සභාවටද දැරීමට සිදුවේ.එබැවින් කිතුණු සභාව ඇදහිල්ලෙන් ශක්තිමත් වීමට අවශ්‍යය.

- ★ **දෙවියන්වහන්සේගේ වැඩ සිටීම (සිංහාසනය) කෙරෙහි ඇදහිල්ල තබන්න - (එළිදරව් 4:2-3 / හෙබ්‍රෙව් 4:16 / හෙබ්‍රෙව් 12:2 / යෙසායා 45:5 හා 18).**
- ★ **දෙවියන්වහන්සේගේ වෙනස් නොවන ස්වභාවය කෙරෙහි ඇදහිල්ල තබන්න - (මලාකි 3:6).**
- ★ **දෙවියන්වහන්සේගේ පොරොන්දු කෙරෙහි ඇදහිල්ල තබන්න - (1 පේත්‍රුස් 1:4 / යාකොබ් 1:12 / රෝම 19-22).**
- ★ **දෙවියන්වහන්සේගේ විශ්වාසවන්ත භාවය කෙරෙහි ඇදහිල්ල තබන්න - (1 කොරින්ති 10:13 / 2 තිමෝති 2:13 / 1 පේත්‍රුස් 4:19 / එළිදරව් 19:11).**
- ★ **දෙවියන්වහන්සේගේ බලය කෙරෙහි ඇදහිල්ල තබන්න - (මතෙව් 28:18 / එපීස 1:21 / එළිදරව් 4:11 / රෝම 12:10).**
- ★ **දෙවියන්වහන්සේගේ පුද්ගලික ප්‍රේමය කෙරෙහි ඇදහිල්ල තබන්න - (එපීස 2:4 / 1 යොහාන් 3:1 / 1 යොහාන් 4:8-9 / මතෙව් 10:30 / මතෙව් 10:29).**

## 03 යාච්ඤාව කරණකොටගෙන ජය ගැනීම - (මාර්ක් 9:29)

කිතුණුවන්ට හෝ කිතුණු සභාවට කරන ඕනෑම පීඩා කරදර කරන පුද්ගලයන්, කණ්ඩායම්, සංවිධාන හෝ වෙනත් දේවල් පිටුපස සිටින්නේ සාතන් හා ඔහුගේ දූත සේනාවයි. **එපීස 6** වන පරිච්ඡේදයේ ඉතාම විස්තරාත්මකව මෙම යුද්ධය, ගැටුම විස්තර කර ඇත. ඒ බැවින් යේසුස්වහන්සේ **(මාර්ක් 9:29)** පවසන පරිදි යාච්ඤාවෙන්

හා නිරාහාර යාච්ඤාවෙන් පමණයි මෙම යක්ෂ සේනාව පරාජය කළ හැක්කේ. කිතුණුවන්ට හෝ සභාවට පීඩා කරන සෑම විටම නිරාහාරයෙන් සිට දෙවියන්වහන්සේට යාච්ඤා කිරීම පළමුව හා නොකඩවා කළ යුතු පියවරකි. "අපේ පොරුබැඳීම වනාහි මාංශය හා රුධිරයට (මිනිසුන්ට) විරුද්ධව නොවේ" - **(එපීස 6:12)**. එනම් සාතන් හා ඔහුගේ සේනාවට විරුද්ධවය. පුද්ගලිකව හෝ සභාවට පීඩාව එල්ල වෙන හැම විටම අප නිරාහාරයෙන් සිට අපගේ දණහිසින් ඊට එරෙහිව නැගී සිටීම හොඳම හා ප්‍රතිඵල ගෙන දෙන ක්‍රියාවකි. අතීතයේ සිට දෙවියන්වහන්සේගේ මිනිසුන්, එසේ කළ බව බයිබලය සාක්ෂි දරයි. ඔවුන්ගේ යාච්ඤාවෙන් පසු දෙවියන්වහන්සේගේ ජනතාව ලැබූ විජයග්‍රහණය පිළිබඳව බයිබලය වාර්තා කරයි.

★ **මොසෙස්ගේ අත් එසවීම නොහොත් යාච්ඤාව - (ගණන් කථාව 12:3-7)**

**ප්‍රතිඵලය -**

යුද්ධය ජයගැනීම, සතුරා පරාජය වීම - **(1 තිමෝති 2:8).**

★ **එස්රා නිරාහාරව යාච්ඤා කිරීම - (එස්රා 8:21 -23).**

**ප්‍රතිඵලය -**

වහල්කමෙන් මිදීයාම, නැවත යෙරුසලමට පැමිණීම, දේව මාළිග ාව ගොඩනැගීමට අවශ්‍ය සම්පත් නොමිලේම ලැබීම හා දේව මාළිගාව නැවත ගොඩනැගීම.

★ **නෙහෙමියා නිරාහාරව යාච්ඤා කිරීම - (නෙහෙමියා 1:4 / 9:1)**

**ප්‍රතිඵලය -**

නැවත යෙරුසලමට යෑමට රජුගෙ න් අවසර ලැබීම, දින 52කින් පවුර ගොඩනගා වැඩ අවසන් කිරීම හා සතුරාගේ පරාජය.

★ **එස්තර් බිසව නිරාහාරයෙන් යාච්ඤා කිරීම - (එස්තර් 4:3 / 9:1)**

**ප්‍රතිඵලය -**

කුමන්ත්‍රණය පරාජය වීම. යුදෙව් ජනතාවගේ සෑම ජීවිතයක්ම ආරක්ෂාවීම හා සතුරාට දඬුවම් ලැබීම.

★ **දාවිත් රජතුමා නිරාහාරව යාච්ඤා කිරීම - (ගීතාවලිය 34:6). (දාවිත් භායනක ලෙස පාපයට වැටුණු අවස්ථාව) - (ගීතාවලිය 51:1-19).**

**ප්‍රතිඵලය -**

පරාජිත හා පව්කාර ජීවිතයෙන් ගොඩ ඒම හා ජයග්‍රාහී ආත්මික අඩිතාලමක් ඇතිවීම හා දෙවියන්වහන්සේගේ කරුණාව භුක්ති විඳීම.

★ **දානියෙල් නිරාහාරව යාච්ඤා කිරීම - (දානියෙල් 9:3). යෙරුසලම අවුරුදු 70 පාලුව තිබීම හා එහි ජනතාව වහල්කමේ සිටීම පිළිබඳව.**

**ප්‍රතිඵලය -**

දානියෙල්ට ලෝකයේ අනාගතය පිළිබඳව විශේෂ එළිදරව්ව දෙවියන්වහන්සේගෙ න් ලැබීම හා සියල්ලම තේරුම් ගැනීමට විශේෂ ප්‍රඥාවක් දෙවියන්වහන්සේගෙන් ලැබීම.

★ **යේසුස්වහන්සේ දින 40 ක් නිරාහාරව යාච්ඤා කිරීම - (මතෙව් 4:2).**

**ප්‍රතිඵලය -**

යක්ෂයාගේ හා මිනිසුන්ගේ විරුද්ධ කම් ජයගැනීමේ බලය ලැබීම. උන්වහන්සේගේ ඉදිරියේ තිබූ මහත් සේවය හා පාප පූජාව ඔප්පු කිරීම සඳහා ස්වර්ගික අධිකාරීත්වය, බලය හා

අනුග්‍රහය ලැබීම. (මනුෂ්‍ය සංහතියටම ගැලවීම ලැබීම).

★ **ආනා නම් ස්ත්‍රිය යාච්ඤා කිරීම - (ලූක් 2:37)**

ප්‍රතිඵලය - අවුරුදු අසූ හතරක් වැන්දඹුවක් ලෙස දෙවියන්වහන්සේට සේවය කිරීමට අනුග්‍රහය හා ලොවට පැමිණි ගැලවුම්කරුවා දැකගැනීම හා එම ගැලවීම ගැන අන් අයට ප්‍රකාශ කිරීමට අවස්ථාවක් හා හැකියාවක් ලැබීම.

★ **ප්‍රේරිතයන් නිරාහාරයෙන් යාච්ඤා කිරීම - (ක්‍රියා 13:3).**

ප්‍රතිඵලය - පාවුල් හා බාර්ණබස් කරණකොට ගෙන මුළු යුරෝපය පුරාවට සුභාරංචිය පතල වීම හා පලාත් සභා බිහිවීම.

## 04. යහපත්කමෙන් නපුර ජය ගැනීම - (රෝම 12:21).

**"නුඹලාගේ සතුරන්ට ප්‍රේමකරපල්ලා, නුඹලාට පීඩා කරන්නන් උදෙසා යාච්ඤා කරපල්ලා" (මතෙව් 5:44).**

පීඩාව ජය ගැනීමේ තවත් බයිබලීය පිළිවෙතක් වන්නේ නපුරට නපුර නොකර ඊට එරෙහිව යහපත කිරීමය. මෙය ඉතාමත් අපහසු නමුත් ගැඹුරු දේව ධර්මීය ප්‍රතිපත්තියකි. ඔබත් යහපතින් නපුර ජයගත් බයිබලීය මිනිසුන් ගැන සොයා දැනගන්න.

## 05 දෙවියන්වහන්සේගේ අබිමුඛය කරණකොට පීඩාව ජයගැනීම - (මතෙව් 18:20 / ගීතාවලිය 16:11 / යෙසායා 63:....)

මෙහිදී සිදුවන්නේ අප දෙවියන්වහන්සේ සමඟ ඇති පුද්ගලික සම්බන්ධතාවය, භක්තිවන්තකම, පුද්ගලික ශුද්ධකම වර්ධනය කර ගැනීම මඟින් පීඩාව විඳදරා ගැනීමට ස්වර්ගයෙන් ශක්තිය හා අනුග්‍රහය ලබා ගැනීමයි. දෙවියන්වහන්සේ ක්‍රියා කරන තෙක් බලා සිටීම හා ඉවසා දරාගැනීමයි. දෙවියන්වහන්සේ අභිමුඛයට නිතර ප්‍රිය කළ අය පිළිබඳව දේවවචනයෙන් සොයා බලන්න.

ප්‍රිය මිතුරු මිතුරියනි, ඇදහිලිවන්තයෙක් ලෙස ඔබ යේසුස්වහන්සේ නිසා හෝ පුද්ගලික කාරණයක් නිසා හෝ යම් පීඩා කරදර විඳින්නේ නම් ශක්තිමත්ව ධෛර්යමත්ව සිට බයිබලය ආදර්ශය හා ප්‍රතිපත්ති ලෙස ඊට එරෙහිව ක්‍රියා කර දෙවියන්වහන්සේ දෙන විජයග්‍රහණය අත් දකින්න. දෙවියන්වහන්සේගේ කරුණාවත්, අනුග්‍රහයත්, ඉවසීමත්, යේසුස් ක්‍රිස්තුස්වහන්සේ කරණකොට ගෙන ඔබ සියල්ලන් සමඟ වේවා!

- සංස්කාරක -
**එස්. මෙත්තානන්ද**
**077 8813197**

සාක්ෂිය

# ප්‍රීතියට මග

අන්‍යාගමික පසුබිමක් සහිත පවුලක මා ඉපදුනේ බදුල්ල දිස්ත්‍රික්කයේය. ළමා අවධියේ පටන් සැහැල්ලු ජීවිතයක් ගත කරන්නට මා පුරුදුව සිටියෙමි. යහළුවන් අතර ගායකයෙක් ලෙස හොඳ පිළිග ැනීමක්ද විය. විවිධාකර ප්‍රශ්ණ කරදර මාගේ පවුල තුළට ගලා ආවත් ඒවා ගැන වැඩි කනස්සලු වීමක්වත් කරදරවීමක්වත් මට නොවීය. නිතරම ඉතා හොඳ ඇඳුම් වලින් සැරසී යහලුවන් සමඟ විනෝදයෙන් කාලය ගත කළෙමි. නිතරම ගායනයෙන් අන් අයව සතුටු කළෙමි. කාලය ගෙවී යන අතර පවුලේ අයගෙන් වෙන්ව රැකියාවක් සොයා ගැනීමේ අරමුණෙන් කොළඹට පැමිණියෙමි. නමුත් එය මා සිතූ තරම් සුන්දරවූත් ලෙහෙසිවූත් එක්ක නොවීය. කුසගි න්න නිවා ගැනීමට හා නවාතැනක් සොයා ගැනීම මට බොහෝ සෙයින් අසීරු විය. කාලය ගතවිය. මා රැ කියාව කරන ස්ථානයේ මා හිත හොඳ මිනිසෙකු ලෙස සියල්ලන් අතර ප්‍රසිද්ධව සිටියෙමි. යෞවන වයසේ මැද භාගය පසුකරමින් සිටි මා හට, රැකියා ස්ථානයේ වැඩිහිටියකු විසින් ඔහුගේ ඥාති දියණියක ගැන කළ යෝජනාවකින් මට මාගේ බිරිඳව මුණගැසිණි. පුහු ආටෝපයෙන් හා කලබල බවින් තොර ඈ අප්‍රහිත ධෛර්යයකින් යුතු අහිංසක තැනැත්තියකි. ඇය ගැන මා නිරතුරුව දෙවියන්වහන්සේට ස්තූතිවන්ත වෙමි. විවාහයෙන් පසු බිරිඳගේ නිවසට යාබදව ජීවත්වීමට පටන් ගත්තත් බිරිඳගේ නැදෑයින් සමඟ වූ සිත් අමනාපකම් හේතුකොට ගෙනත් රජයේ ඉඩම්කැබැල්ලක් ලැබීම නිසාත් පදිංචිය වෙනස් කිරීමට අපට සිදුවිය.



ජීවත්වීමට බොහෝ වෙහෙසීමට සිදුවුණි. දරුවන් තිදෙනෙකු සමඟ අපි බොහෝ දුක් කම්කටොළු වලට මුහුණ දීමට සිදුවුණි. දිනපතාම මත් වතුර තොල ගා ගත් මාගේ නොසැලකිලි බව හා වගකීම් රහිත බව හමුවේ මගේ බිරිඳගේ ධෛර්ය හා කැපවීම දරුවන්ට යෝධ ශක්තියක් විය. කාලය ගත වූවත් තත්වය එසේමය. දරු පවුල රක්ෂා කිරීම සඳහා මා

විවිධ රැකියාවල නිරත වූයෙමි. නමුත් එය පවුලේ වියදම පිරිමසා ගැනීමට ප්‍රමාණවත් නොවීය. මට සහ දරුවන් තිදෙනාට ගායන හැකියාවක් තිබූ නිසා "මාවතේ අපි" යන්නෙන්, දුම්රියේ හා බස්රථවල ගායනා කිරීම ආරම්භ කළෙමු. දරුවන් සමඟ අපි බොහෝ තැන්වල ගමන් කළෙමු. එය කිසිසේත්ම ලෙහෙසි පහසු දෙයක් නොවීය. මමත් මාගේ බිරිඳත් පුදුමාකාර අත්දැකීම් වලට මුහුණ දුන්නෙමු. අනේකාකාර දුක් කම්කටොලු විඳදරා ගත්තෙමු. මා සමඟ එක හා සමානව සමහර විට ඊටත් වඩා මගේ බිරිඳ දුක ඉවසුවාය. නෑදෑයින් අපව පිළිගන්නට පවා අකමැති විය. අප ගැන ඔවුන් ලැජ්ජාවට පත්විය. දිනක් අප ගායනාවේ යෙදුන බස් රථය අනතුරකට පත් වූයෙන් දින කිහිපයක් අපට රෝහලේ ගත කරන්නට සිදු විය. ජීවිතය ගැන පුදුමාකාර කලකිරීමක් මා තුළ විය. අනතුරින් පසු නිවසට පැමිණි අප අසල්වැසි නිවසක අවමංගල්‍යයකට සහභාගී වී සිටියෙමු. මේ අවස්ථාවේ එහි පැමිණ සිටි දේවදාසයෙකු දැන හඳුනාගෙන කතා බහක යෙදුනෙමි. අප ගැන තොරතුරු අසා දැනගත් ඔහු යේසුස් ක්‍රිස්තුස්වහන්සේ ගැනත්, උන්වහන්සේගෙන් ලැබෙන පවිකමාව ගැනත් අපට පහදා දුන්නේය. ඔහු පැවසූ දේවල තිබූ පුදුමාකාර බව ගැන කල්පනා කළ මා වඩාත් උන්වහන්සේ ගැන දැනගනු රිසිව ඔහු ලබාදුන් ලිපිනය සොයාගෙන ඉරුදින දේව සභාවට ගියෙමි. උන්වහන්සේ මාගේ හදවත විවර කළ සේක. පරම සත්‍යය පිළිගැනීමට සැලැස්සූසේක. මා උන්වහන්සේගේ පාද පාමුල දණ නමා මාගේ පව්කියාදී යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ ශ්‍රී රුධිරයෙන් කරණකොටගෙන සමාව ලැබුවෙමි. මාත් මාගේ පවුලේ අයත් උන්වහන්සේ පිළිගෙන අදහා ගත්හ. පුදුමාකාර සතුටකින් මගේ හදවත පිරී යන්නට විය.

අපේ තත්වය තවමත් එලෙසය. මාවතේ ගී කියන්නන්ය. නමුත් හදවතේ තත්වය වෙනස්ය. ප්‍රීතිය, සතුට, සාමය හා එකමුතු බව මගේ පවුල තුළ උතුරා යන්නට විය. අප ගී ගයන්නට යන සෑම තැන්වලට ශුභාරංචිය ප්‍රකාශ කළෙමු. පත්‍රිකා බෙදා දුන්නෙමු. අපේ යැයි කියන මිනිසුන් අප ගැන ලැජ්ජාවී අප කොන් කර දැමුවත්, සභා පවුල සමඟ අපට ප්‍රීතිමත් සහභාගී කමක් විය. සභාව ගොඩනැගී මේ ආත්ම දිනා ගැනීමේ සේවයට මමද පුදුමාකාර පිබිදීමකින් දායක වුනෙමි. දරුවන් සභාවේ ගායන වාදනයට ඉදිරිපත් විය. ශුභාරංචිය බෙදා දීම සඳහා බදුල්ලේ බොහෝ දුෂ්කර මාර්ග ඔස්සේ, සැතපුම් ගණන්



සහෝදරයන් සමඟ ඇවිද ගියෙමි. යේසුස් ක්‍රිස්තුස්වහන්සේ මගේ ජීවිතයේ ස්වාමීන්වහන්සේ ලෙස මා පිළිගත් පසු මගේ ජීවිතය මැජික් බලයකින් මෙන් එක්වර වෙනස්වූයේ නැත. මා එක්වරම ධනවතෙක් වූයේද නැත. ඒ වෙනුවට මාගේ පාප පුරුදු මා අත්හැර දැමුවෙමු. චඩාත් වගකීම් සහගත බවක් මා තුළ විය. මේ වන විට බයිබලයක් ලබාගෙන දිනපතා දේවවචනය කියවීමටත් යාච්ඤා කිරීමටත් මා පුරුදු පුහුණු වෙමින් සිටියෙමි. පවුලේ යාච්ඤාවද අනිවාර්ය අංගයක් විය. සභා සහභාගී කම් පවත්වමින්, උන්වහන්සේට නමස්කාරකරන්නටත්, රොටි කැඩීමටත් නොවරදවා සහභාගී වුනෙමි. උන්වහන්සේට මාගේ ජීවිතයේ පාලනය බාර දීමෙන් මහත් සතුටක් හා ඕනෑම ප්‍රශ්ණයකට නුවණින් මුහුණදීමට පුදුමාකාර හික්මවීමක් හා ධෛර්යක්ද ලදිමි. කාලය ගෙවී ගියේය. පුතුන් දෙදෙනා උස්මහත්ව රැකියාවන් වල යෙදෙන්නට විය. දියණිය උසස් අධ්‍යාපනයේ නියලුනාය. පසුව පුතුන් දෙදෙනා විවාහ වූ අතර දියණිය පූර්ණකාලීන දේවසේවයට කැපවී පසුව විවාහ වූවාය. මධ්‍යම පලාතෙන් බස්නාහිර පළාතට අපේ පදිංචිය වෙනස් විය. මේ සියල්ල මාගේ ජීවිතයේ උන්වහන්සේගේ සැලසුමය. මා දැන් කිසිවකු සතුටට පත් කිරීමට වෙහෙස නොවෙමි. ඒ වෙනුවට උන්වහන්සේට සැබෑ ලෙස නමස්කාර කරන්නෙක්ව, මාගේ ජීවිතයෙන් උන්වහන්සේව පමණක් සතුටට පත් කිරීමට වෙහෙසෙමි.


මක්නිසාද "**අධිපතීන් සමඟ හිඳුවන පිණිසත්, මහිමයේ සිංහාසනය උරුම කරවන පිණිසත්, උන්වහන්සේ දුප්පතා දූලියෙන් නැගිටුවන සේක. දිළින්දා කසල ගොඩින් ඔසවන සේක" (1 සාමුවෙල් 2:8).** යන්න සත්‍යයකි.

මාගේ ජීවිතයේ ස්වාමින්වහන්සේ වූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේට ස්තූතියත් ප්‍රශංසාවත් ගෞරවයත් නමස්කාරයත් සදාකාලයටම වේවා

**- ධනපාල බුලත්ගම -**
**පිළියන්දල**

# ව්‍යවස්ථාව සම්පූර්ණ කිරීම.

ප්‍රේමවන්ත සොයුර සොයුරිය අප ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස් සමිදාණන්ගේ සභාව වර්ධනය උදෙසා කිතුණුවන් වු අප කාටත් පැවරී ඇති කාලෝචිත වගකීමක් පිළිබඳ කතා කරන්නටයි මාගේ මේ උත්සාහය. අපගේ අවධානයෙන් බැහැරව ගිය මෙම ක්‍රියාව පිළිබඳ දේව වචනය තුළ බොහෝ ස්ථාන වල අපට නොයෙකුත් ආකාරයෙන් හමුවෙයි. ඒ අනිකක් නොව බර ඉසිලීම පිළිබඳවයි. එකිනෙකාගේ බර ඉසිලීම යන්න සභාවේ වර්ධනය උදෙසා සිදු කරනු ලබන ක්‍රියා අතුරින් විශේෂ තැනක් ගනු ලබන ක්‍රියාවකි. මෙය බොහෝ දෙනෙකු හරි හැටි තේරුම් නොගත් දෙයකි. **(ශු. මාර්ක් 2:3)**. එය අපට සතර දෙනෙකුගෙන් යුතු ක්‍රියාවක් තුලින් මනාව පෙන්වයි. **"එකල සතර දෙනෙකු විසින් උසුලන ලද අංශභාග රෝගියෙකු රැගෙන ඔවුහු උන්වහන්සේ වෙතට ආවෝය".**



සතර දෙනෙකු විසින් ඔසවා ස්වාමීන්වහන්සේ වෙතට ගෙන ආ මේ මිනිසා අංශභාග රෝගියෙකු බව දේව වචනය පවසයි. අංශභාග රෝගියෙකු යනු ඇතැම් විට කිසිදු කල්පනාවක් නොමැති කිසිවක් කර කියා ගත නොහැකි අයෙකි. එම රෝගයේ අන්දම එසේ නමුත් සතර දෙනෙකු විසින් කරන ලද සේවය අති මහත්ය. මන්ද කිසිවක් කර කියා ගත නොහැකි රෝගියාව උසුලා ජීවනදායක තැනැන්වහන්සේ වෙතට ගෙන ඒම මහත් අගනා කටයුත්තකි. **"එකිනෙකාගේ බර උසුලා එසේ ක්‍රිස්තුස්වහන්සේගේ ව්‍යවස්ථාව සම්පූර්ණ කරපල්ලා...." (ගලාති 6:2)**

මින් අපට පෙන්වනුයේ මනුෂ්‍යයන් පිළිබඳව ඔවුන්ගේ ආත්ම වල බර දැරීමේ වගකීම පිළිබඳවයි. කිසිවක් කර කියා ගත නොහැකි ආත්මිකව දුර්වල අයෙකුව ඔහුගේ බර දරමින් ස්වාමීන්වහන්සේ වෙතට ගෙන ඒමේ කටයුත්ත අපට අමතක වී ගොසිනි. අන් අයගේ බර ඉසිලීමේ සේවය අපට මතක් කර දෙන **මාර්ක් 2:3** අප සිහි තබා ගත යුතුය. ඔබ කොතෙක් දුරට මේ සතර දෙනා කළ ඒ උතුම් සේවය සිදු කරනවාද යන්න මඳක් සිතා බලන්න. සභා වර්ධනයට අප සියල්ල එකම සේවාවක් කිරීම කිසිසේත්ම ප්‍රමාණවත් නොවේ. එය විවිධය. අද ස්වාමීන්වහන්සේව පිළිග ැනීමට නොහැකිව අනාවබෝධයෙන් උන්වහන්සේ වෙතට යාමට නොහැකිව කී දෙනෙකු අංශභාග රෝගීන් මෙන් එක්තැන්ව එක් රාමුවකට කොටු වී සිටිනවාද? ඔවුහු තමන් අදහන ආගම් මාලාවේ නීති රීති වල සිරවී ඇති නිසා ඇත්තාවූ සත්‍යතාවය නොදකියි.

ඔවුන් දරාගෙන ස්වාමීවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ වෙතට ගෙන ඒම අප සතු ක්‍රියාවකි. ඉහත කී සතරදෙනා මෙන්ම එබඳුවූවන්ව ස්වාමීන්වහන්සේ වෙතට ඔසවා තැබීමද ස්වාමීන්වහන්සේ අපටද පවරා ඇත. **2 ලේකම් 2:2** හිදු, අපට තවත් බර උසුලන පිරිසක් මුණගැසේ. සාලමොන් රජු දේව මාළිග ාව ගොඩ නැගීමේ කටයුතු කරන විට එයට බර ඇදීම සඳහාද මිනිසුන් සැත්තෑ දහසක් පත් කළ බව කියයි. මෙහි අප දකිනුයේ දේව මාළිගය ඉදි කිරීම සදහා ඔවුහු දැරූ නොමසුරු දායකත්වයයි. වර්තමානයේ අපටද මෙලෙස ක්‍රිස්තුස්වහන්සේගේ සභාව ගොඩ නැගීමේ කටයුත්තේ යෙදිය යුතු වෙමු. සන්බලට් නම් විරුද්ධවාදියා හමුවෙහි නොනැවතී පවුර ගොඩ නැගූ නෙහෙමියා මෙන් **(නෙහෙමියා 4:17)** සභාව ගොඩනැගී මෙහිලා දායක වන කවරෙකු හෝ වේවා ඔහු මෙන්ම ඇය, කරන්නේද මහත් අගනා සේවයකි.

**බාහිරවූ ඒ දේ හැර සියලු සභාවන් ගැන සිතේ බරක් දවස් පතා මට ඇත්තේය (2 කොරින්ති 11:28).**

ප්‍රේමවන්ත සොයුර සොයුරියනි, එක්කෙනෙකු හට භාර කර තවකෙනෙකුට නිදහස් වීමට නොහැකි මෙම සේවය නම් බරදැරීම අප සතු වගකීමකි. අප සියල්ලන් හට මෙම වගකීම එනම් සභාවේ බර දැරීම තිබිය යුතුම වේ. එය ඇල් මැරුණු සභාවක නව පිබිදීමක් හට ගැනීමට හේතු වේ. සභාව රෝපණය කිරිමෙහිලා විශේෂ බරක් දැරූ පුරෝගාමියෙකු වූ ශුද්ධ වූ පාවුල් තුමා හට තම සභාව පමණක් නොව සෙසු සභාවන් පිළිබඳවද බරක් තිබූ බව ඔහුගේම වචන වලින් පවසයි. **"තවද ඔහු නික්ම යද්දී සීමොන් නම් කිරේනියේ මනුෂ්‍යයෙකු සම්බවී උන්වහන්සේගේ කුරුසිය උසුලාගෙන යන්න ඔහුට බල කළෝය" (මතෙව් 27:32).**

සීමොන් කිසිදු මැසිවිල්ලක් නොපවසා කුරුසියේ බර සිය කර මතට ගෙන නිහඬව උන්වහන්සේ පසුපස ගමන් කළේය. ප්‍රේමවන්ත සහෝදර සහෝදරියනි ඔබ සුදානම්ද මෙලෙස සභාවේ බර හා තම ජීවිතේ බර දරමින් උන්වහන්සේ පසු පස ගමන් කරමින් සාර්ථක කිතුණුවෙකු වන්න. එසේ නම් සත්‍යය වශයෙන්ම ඔබත් එදා කිසිවක් කර ගත නොහැකි අසරණ අංශභාග රෝගියා උසුලා ජීවනදායක යේසුස් ක්‍රිස්තුස්වහන්සේ වෙතට ගෙන ගිය ඒ සතර දෙනාගෙන් එක් අයෙකි. අද අප බොහෝ දෙනෙකුට අමතකවූ අන් අයගේ බර ඉසිලීමේ මහඟු ආත්මික සේවය මෙසේ පටන් ගැනීමට ඉක්මන් වෙමු. එය ක්‍රිස්තුස්වහන්සේගේ සභාව වර්ධනය කිරීමට බෙහෙවින් උපකාර වනු ඇත. ඔබ සැමට ස්වාමීවූ යේසුස්වහන්සේගේ පිහිටයි !

**- මැතිව් ප්‍රියංකර ෆොන්සේකා -**

# දෙවියන්වහන්සේගේ සත්ප්‍රකාර විශ්වාසවන්තකම
## (ගීතාවලිය 36:5 / විලාප ගී 3:23)

**1. කැඳවීමේදී දෙවියන්වහන්සේගේ විශ්වාසවන්තකම (1 තෙසලෝනික 5:24)**

අ) **උතුම් කැඳවීම** - පිලිප්පි 3:14

- **මහෝත්තමයාණන්ගේ දරුවන්වීමට** අපව උතුම් කැඳවීමකින් කැඳවා ඇත - ලූක් 6:35.

ආ) **ශුද්ධවූ කැඳවීම** - 2 තිමෝති 1:9

- ශුද්ධ වූ කැඳවීමෙන් අපව **ශුද්ධකමට** කැඳවා ඇත - 1 තෙසලෝනික 4:7

ඉ) **ස්වර්ගික කැඳවීම** - හෙබ්‍රෙව් 3:1

- **උන්වහන්සේ සිටින තැන අපත් සිටින පිණිස** ස්වර්ගික කැඳවීමකින් අපව කැඳවා ඇත- යොහාන් 14:2-3

**2. කමාව දීමේදී දෙවියන්වහන්සේගේ විශ්වාසවන්තකම - (1 යොහාන් 1:9)**

අ) අපට **කමාව දී තිබේ** - 1 යොහාන් 2:12

- කොන්දේසි දෙකකි
  1) අපි **පාපොච්චාරනය කරන විට** - 1 යොහාන් 1:9
  2) අපි **අන් අයට සමාව දෙන විට** - මතෙව් 6 : 14-15

ආ) අපේ **පාප සිහිනොකර ඇත** / අමතක කර ඇත - හෙබ්‍රෙව් 10:17

**3. සහභාගීකමේදී දෙවියන්වහන්සේගේ විශ්වාසවන්තකම (1 කොරින්ති 1:9).**

අ) **පුත්‍රයාණන්ගේ සහභාගිකමට** අපව කැඳවා ඇත - කොරින්ති 1:9

- එහි ප්‍රතිඵලය **ඵල සහිත භාවය** - යොහාන් 15:4-5

ආ) **ආත්මයාණන්වහන්සේගේ සහභාගිකමට** අපව කැඳවා ඇත - පිලිප්පි 2:1

- එහි ප්‍රතිඵලය **එක්සිත්කම** - 1 කොරින්ති 12:13

ඉ) උන්වහන්සේගේ **දුක්විඳීම්වල සහභාගිකමට** අපව කැඳවා ඇත - පිලිප්පි 3:11

- එහි ප්‍රතිඵලය **මහිමය** - රෝම 8:17

**4. පරීක්ෂාවේදී දෙවියන්වහන්සේගේ විශ්වාසවන්තකම (1 කොරින්ති 1:9)**

අ) අපව පරීක්ෂාවෙන් **වැලැක්වීම** - යාකොබ් 1:13

ආ) අපව පරීක්ෂාවෙන් **ආරක්ෂා කිරීම** - 1 කොරින්ති 10:13

ඉ) අපට පරීක්ෂාවේදී **පිහිට වීම** - හෙබ්‍රෙව් 2:18

**5. පොරොන්දුවීමේදී දෙවියන්වහන්සේගේ විශ්වාසවන්තකම (කොරින්ති 1:9)**

අ) උන්වහන්සේ **ජීවනය නැමති පොරොන්දුව** අපට දී තිබේ - 1 තිමෝති 4:8

- **සදාකාල ජීවනය** - 1 යොහාන් 2:25 / 5:13

ආ) උන්වහන්සේ **ආත්මයාණන්වහන්සේ නැමති පොරොන්දුව** අපට දී තිබේ - ගලාති 3:14

- **ශුද්ධාත්මයාණන්වහන්සේ** - යොහාන් 14:16-17

ඉ) අපට **සදාකාල උරුමයේ පොරොන්දුව** දී තිබේ - හෙබ්‍රෙව් 9:15

- **සදාකාල උරුමයේ** - 1 පේත්‍රුස් 1:4
  - ▲ ස්වර්ගයෙහි තබා තිබෙන
  - ▲ ජරාවට නොපැමිණෙන
  - ▲ නොකිලිටිවූ
  - ▲ පහනොවන

**6. ආරක්ෂා කිරීමේදී දෙවියන්වහන්සේගේ විශ්වාසවන්තකම (2 තෙසලෝනික 3:3)**

අ) අපව **නපුරාගෙන්** ආරක්ෂාකිරීම - 2 තෙසලෝනික 3:3

ආ) අපි **නොපැකිලෙන ලෙස** ආරක්ෂා කිරීම - යූද් 24

ඉ) අපව **පරීක්ෂාවේ පැයෙන්** ආරක්ෂා කිරීම - එළිදරව් 3:10

ඊ) අපව **ඒ දවස දක්වා** ආරක්ෂා කිරීම - 2 තිමෝති 1:12

**7. ස්වාමින්වහන්සේ තුළ පැවතීමේදී දෙවියන්වහන්සේගේ විශ්වාසවන්තකම (1 කොරින්ති 1:9)**

අ) උන්වහන්සේ තුළ පැවතීම

- උන්වහන්සේ තුළ පැවතීමේදී **ඵල සහිතභාවය** ඇත - යොහාන් 15:5

ආ) උන්වහන්සේගේ **වචනය තුළ** පැවැතීම


- උන්වහන්සේගේ වචනය තුළ පැවතීමේදී **යාච්ඤාවට පිළිතුරු** ලැබෙයි - යොහාන් 15:7

ඉ) උන්වහන්සේගේ ප්‍රේමය තුළ පැවැතීම හෙබ්‍රෙව් 9:15

- උන්වහන්සේගේ ප්‍රේමය තුළ පැවැතීමේදී **ප්‍රීතියේ සම්පූර්ණභාවය** ඇත - යොහාන් 15:9-11

**- දිනේෂ් මැල්කම් පෝල් -**

# ලිදියා



**"ගුණවන්ත ස්ත්‍රියක් කාට සම්බවේද? ඇගේ අගය රතුකැට වලට වඩා වැඩිය" (හිතෝපදේශ 31:10).**

ස්ත්‍රියකගේ කැඳවීම ඉතා උතුම්ය. ස්ත්‍රියකටම ආවේනික ගුණාංග තුලින් ඇයට දෙවියන්වහන්සේව ගෞරවයට පත් කළ හැකියි. සැබවින්ම ස්ත්‍රියට පවුල තුළ තිබෙන වගකීම් හා යුතුකම් ප්‍රමාණය මහත්ය. දියණියක, මවක හා සොයුරියක ලෙස ඇගේ භූමිකාවේ වපසරිය ඉතා විශාලය. පුරුෂයකුට වඩා බොහෝ වැඩ කොටසක් ස්ත්‍රියට පවරාදීමට සමාජීය පසුබිම සැකසී තිබේ. තමාගේ අවට සිටින්නන් වෙනුවෙන් මුළු දවස පුරාම වෙහෙසෙන ස්ත්‍රියට ඇය බලාපොරොත්තු වන සියළු වගකීම් හා යුතුකම් ඉටු කර ගත නොහැකි වීමට පුළුවන. ගෙදර දොර වැඩ, දරුවන්ගේ අධ්‍යාපන කටයුතු, දෙමව්පියන්ගේ ඕනෑ එපාකම්, හා සැමියාගේ රැකියාවට උදව් දීම හෝ නිවසේ ආර්ථිකය සරිකිරීමට ව්‍යාපාරයක් හෝ රැකියාවක නිරත වීමටත් වත්මන් ස්ත්‍රියට සිදු වේ. මේ සියලු යුතුකම්, වගකීම් අතරේ සැබෑවටම ස්ත්‍රියකට පැවරෙන වටිනාම වගකීම කුමක්ද? ඒ සඳහා අපි "ලිදියා"ගේ චරිතය උපහැරණයට ගෙන පිළිතුරු සොයමු.

ශුද්ධ බයිබලයේ **ක්‍රියා පොතේ 16** වන පරිච්ඡේදයේ ලිදියා ගැන සඳහන් වේ. මෙම පරිච්ඡේදයේ සඳහන් පරිදි පාවුල්තුමා තම දූත මෙහෙවරේදී මකිදෝනියේ නුවරක් වූ පිලිප්පියට පැමිණ සිටියේය. ලිදියා ද ජීවත්වූයේ පිලිප්පියේ ය. පාවුල් තුමා දේශණා කිරීමට ගිය ස්ථානයකදී ලිදියා ඔවුන්ට සම්බවිය. **"සබත් දවසේදී අප පිටත්ව නුවර දොරටුවෙන් පිට යාච්ඤා ස්ථානයක් ඇතැයි අපට කල්පනා වූ ගංගාවක් අද්දරට ගොස් හිඳ, රැස්ව සිටි ස්ත්‍රීන්ට කථාකළෙමුව. තියාතිරා නුවර විසූ රත්නිල් පිළි විකුණන්නාවූ ලිදියා නම් දේවභක්ති ස්ත්‍රියක් අපේ වචන අසාගෙන සිටියාය"(ක්‍රියා 16:13-14).** ඉහත දේව වචන කොටසෙහි ඇය මුණ ගැසුනේ ගඟ අද්දර පිහිටි යාච්ඤා ස්ථානයකදී. සබත් දවසේදී ඇය යාච්ඤා ස්ථානයක සිටියේ ඇයි? ඇය අන් ස්ත්‍රීන් සමඟ යාච්ඤා කරන්නටය. ඒ සඳහා ඇය නුවරින් පිටතට පැමිණියාය. පවුලේ සියලු කටයුතු අතර සබත් දින දෙවියන්වහන්සේ වෙනුවෙන් ඇය වෙන් කර තිබෙනවා නොවේද? ඔබත් ඔබේ සියලු වැඩ කටයුතු අතරේ දෙවියන්වහන්සේගේ වේලාව උන්වහන්සේ වෙනුවෙන් කැප කරනවාද?

සැබවින් පාවුල් ඇතුලු පිරිසට ලිදියා මුණ

ගැසුනේ පිලිප්පියේදීය. නමුත් ඇයව හඳුන්වා දී තිබෙන්නේ **"තියාතිරා නුවර විසූ"** ලෙසය. තියාතිරා නුවර පිහිටා තිබෙන ආසියා මහද්වීපයේය. ආසියා මහද්වීපයේ සිට යුරෝපා මහද්වීපයට ඇය ඇගේ පවුල සමඟ සංක්‍රමණය වී ඇත. තව දුරටත් ඇයව රත්නිල් පිළි විකුණන තැනැත්තියක් ලෙසද දේව වචනයෙහි සඳහන්ව තිබේ. එනම්, ඇය ව්‍යාපාරික කාන්තාවක්. රෙදි පිළි වෙළඳාම ඇගේ වෘතියයි. ඇය අලෙවි කරනු ලබන රෙදි වර්ගය ගැන නිශ්චිත හැඳින්වීමක් කර තිබෙනවා. **"රත් නිල්"** වර්ණයෙන් යුතු සේද එකල බොහෝ විට රත්නිල් හෙවත් දම් පැහැයෙන් යුතු වර්ණය අධික මිලෙන් යුක්තය. මෙවැනි පිළි බොහෝ විට භාවිතා කළේ සිටුවරු, ප්‍රභූවරු, රජවරු වැනි ඉහළ පැළැන්තියේ මිනිසුන්ය. එසේ නම් ඇය අතමිට සරු, සාර්ථක ව්‍යාපාරයක් හිමි, ඉහළ පැලැන්තිවල මිනිසුන් ඇසුරුකරන්නියක්. ඇගේ බාහිර පරිසර සාධකයන් එසේ වුවත් ඇයව **"දේව භක්තික"** තැනැත්තියක් ලෙසද විස්තර වෙනවා. පවුලේ වැඩ, ව්‍යාපාරයේ වැඩ ඇතුලු සියලු වැඩ අතර ඇය දෙවියන්වහන්සේට තම ජීවිතයේ නියම ස්ථානය පළමුකොට දී තිබෙනවා. එය අපට මොනතරම් ආදර්ශයක්ද?

ලිදියා දේව භක්තික කාන්තාවක්ව සිටියත්, ඇය ගැලවීම ලැබුවේ පාවුල් තුමාගේ ශුභාරංචි ප්‍රකාශනයෙන් පසුව බව **"පාවුල් විසින් කියන ලද කාරණා සලකන ලෙස ස්වාමීන්වහන්සේ ඇගේ සිත විවර කළ සේක" (ක්‍රියා 16:14ආ)** කොටසෙන් පැහැදිලි වේ. අනෙක් සියලු කාරණා, වගකීම්, යුතුකම්වලටත් වඩා වටිනාම හා උතුම්ම වගකීම ඇගේ පවුල වෙනුවෙන් ඇය ඉටු කළාය. සමහර විට ඇයට මෙය පහසු කාරණයක් නොවන්නට ඇත. දෝෂාරෝපණ, විවේචන, සිත් රිදීම් වලට ද ඇයට මුහුණ දීමට සිදුවන්නට ඇත. නමුත් ඇගේ ඇදහිල්ල යාච්ඤාව ඇයට ජය ගෙන ආවාය. **"ඈද ඇගේ ගෙයි වැසියන්ද බව්තීස්ම ලැබුවායින් පසු..." (ක්‍රියා 16:15).** ගැලවීම ලබා සිටින අපටද අපේ පවුල් ගැන තිබෙන වගකීම මෙයම නොවේද?

තම පවුල පිළිබඳ වගකීම ඉටුකළ ඇය, ඊළගට ගත් පියවර ප්‍රශංසනීයයි. ඇය සේවයට හවුල් වූවාය **"මා ස්වාමීන්වහන්සේට විශ්වාසව සිටින කෙනෙකැයි නුඹලා ඒත්තු ගෙන සිටිහු නම්, මාගේ ගෙට ඇවිත් නැවතුන මැනවයි අපෙන් ඉල්ලා අප නවත්වාගත්තාය" (ක්‍රියා 16:15).** දේව සේවකයන්ට ආගන්තුක සත්කාර කිරීමට ඇය පසුබට වූයේ නැත. ස්ත්‍රියක් ලෙස ඇයට ද බොහෝ කාර්යබහුල ජීවිතයක් ගතකරන්න වූවා විය හැක. නමුත් ඇය ඇගේ සැබෑ වගකීම අමතක නොකළාය.

**1. ඇය, ස්වාමීන්වහන්සේගේ වචනයට හදවත විවරකරමින් ගැලවීම ලැබුවාය.**
**2. ඇයගේ පවුලේ අයව ගැලවීමට ගෙන ආවාය.**
**3. ඇගේ නිවස සේවයට කැප කළාය.**

සැබවින්ම ගැළවීම ලබා, අර්ථාන්විත කිතුණු ජීවිතයකට ඇතුල්වන ඇදහිලිවන්තයන්ගේ සැබෑම වගකීම, යුතුකම, හා ඉලක්කය මෙයයි. අප සියලු දෙනාම "ලිදියා" මෙන් වන්නට උත්සාහ කරමු.

**- ශෂිලා වාසනා -**

පාඨක පිටුව

# බලාපොරොත්තුව

ඉඩෝරයෙන් කර්කශව ඉරි තැලී දුහුවිලි පිඹින පොළොවට සීතල සුළඟින් යුත් වැහි පොදක් වැටෙනතෙක් ගොවියා බලපොරොත්තුවෙන් අහස දෙස බලා සිටී. ඒ බලාපොරොත්තුවට නිමක් නැත. නැවුම් ලෙස පණ ගැන්වී දළු ලා වැඩෙන්නට පැළයට වතුර අවශ්‍යය. ඒ ගොවියෙකුගේ බලාපොරොත්තුවයි. මවකට දරුවන් ගැන, ක්‍රීඩකයකුට ජයග්‍රහණය ගැන බලාපොරොත්තු ගොන්නක් ඇත. මෙලෙස බොහෝදෙනා බලාපොරොත්තු පොදි බැඳගෙන ජීවත් වෙයි. ඒවා සාර්ථක කර ගැනීමට බොහෝ වෙහෙස මහන්සිවෙයි. එය සත්‍යයකි. ඔබටත් එවැනි බලාපොරොත්තු තිබෙනවා නොවේද?

ප්‍රිය සහෝදර සහෝදරිය, ඔබ ගැන බලාපොරොත්තුවෙන් කෙනෙකු සිටින බව මොහොතකට ඔබ සිතා තිබෙනවාද? මුළු ලෝකය මවා පාලනය කරමින් ඔබව මව් කුසේදී රහසින් තනා මෙලොවට බිහිවෙන්නට සලස්වා, ආරක්ෂා කරමින් රැගෙන යන එකම ජීවමාන දෙවියන්වහන්සේ ඔබ වෙනුවෙන් බලාසිටින සේක. ඒ,

- **ඔබ ඔබගේ පාපයෙන් හැරී උන්වහන්සේ වෙතට එනතෙක්ය.**
- **ඔබගේ හදවත උන්වහන්සේ ඉදිරියෙහි වගුරුවන තෙක්ය.**
- **දිනපතාම උන්වහන්සේගේ හදවත දැනගනු රිසිව උන්වහන්සේගේ පාද පාමුල දණ නමන තෙක්ය.**
- **ඔබ සමඟ කතා කිරීමට ඔබ එනතෙක්ය.**
- **දිනපතාම උන්වහන්සේගේ ප්‍රේමය අලුත් ලෙස ඔබට ලබා දීමටය.**

**"දෙවියන්වහන්සේ විසින් තමන්ට ප්‍රේම කරන්නන්ට සූදානම් කළ දෙයක් ඇද්ද, ඒ දේ ඇසට නොපෙණුනේය, කණට නොඇසුණේය " (1 කොරින්ති 2:9).** දෙවියන්වහන්සේ ඔබ ගැන බලාපොරොත්තුවෙන් සිටින්නේ ඔබව අලුත් වූ සැබෑ වූ ප්‍රේමයකින් ඔබව අලුත් කිරීමටය. සැබෑවටම උන්වහන්සේ ඔබගෙන් බලාපොරොත්තු වන්නේ, ඔබගේ ජීවිතයේ, හදවතේ සහ ක්‍රියාවේ ස්වාමිකත්වයයි. පොළොව ඉඩෝරයෙන් වියලී ඉරිතැලී තිබෙන්නාක් මෙන් ඔබත් මමත් පාපය කරණකොටගෙන මැරී, වියලී, කර්කශව, දෙවියන්වහන්සේගෙන් වෙන්ව, ජීවයක් නොමැතිව සිටින්යෝ වෙමු. නමුත් සිසිලයේ සුළඟින්, ජීවනයේ වතුරෙන් අපව ප්‍රබෝධමත් කර ශුද්ධාත්මයාණන්වහන්සේ අප තුළට එවමින්, කර්කශ පොළොවේ වගා කිරීමට පොළොව සූදානම් කරන ගොවියා, යේසුස්වහන්සේ කුරුසියේ මරණය විඳිමින් අපගේ පාප උන්වහන්සේගේ ශ්‍රී රුධිරයෙන් සෝදා අපව දෙවියන්වහන්සේ හා සමගි කළ සේක. දැන් දිනපතාම උන්වහන්සේ අපගෙන් බලාපොරොත්තු වන්නේ ආත්මයාණන්වහන්සේගේ ඵල (ගලාති 5:22 කියවන්න). ඉපදවීමයි අපගේ එදිනෙදා ජීවිතය තුලින් උන්වහන්සේගේ නාමය උසස් කිරීමයි. "එහෙයින් නුඹලා කතත් බොතත් වෙන යමක් කරතත් සියල්ල දෙවියන්වහන්සේගේ ගෞරවය පිණිස කරපල්ලා" (1 කොරින්ති 10:31).

උන්වහන්සේ ඔබ කෙරෙහි තිබෙන බලාපොරොත්තතුව ඉටු කිරීමට ඔබ සූදානම්ද? ප්‍රමාද නොවන්න. මක්නිසාද ඔබ ඉදිරියෙහි වන කාලය ඉතා ස්වල්පය. දෙව්පියාණන්වහන්සේගේ ප්‍රේමය සහ කරුණාව ඔබ සමඟ වේවා!

**- ප්‍රියන්ති -**
**දෙමටගොඩ**

# කිතුණු පළාත් සභාවක නායකයන් සහා ඇදහිලිවන්තයින් අතර සම්බන්ධතාවය

## ඇදහිලිවන්තයන්ගේ වගකීම.

**01. ඔවුන් දැනගන්න - 1 තෙසලෝනික 5:12**
සභා නායකයන් හොඳින් දැන හඳුනාගැනීම සහ ඔවුන් කිට්ටු සම්බන්ධතාවයක් පවත්වා ගෙන යාම.

**02. ඔවුන් උතුම් කොට සලකන්න - 1 තෙසලෝනික 5:13**
ගෞරවාන්විත හා උතුම් එනම් යේසුස්වහන්සේගේ නියෝජිතයන් ලෙස සැලකීම

**03. ඔවුන්ට ගෞරව කරන්න-1 තිමෝති 5:17**
එනම් තමන්ට හැකි ආකාරයෙන් ද්‍රව්‍යමය හා මුදල්මය උපකාර කිරීම.

**04. ඔවුන් විශ්වාස කරන්න- 1 තිමෝති 5:19**
ඔවුන් යහපත් බව විශ්වාස කරන්න.

**05. ඔවුන්ට කීකරුවන්න - හෙබ්‍රෙව් 13:17**
ඔවුන්ගේ වචනය, අවවාදය, අනුශාසනාව නිවැරදි කිරීම වැනි කාරණා වලදී ඔවුන්ට කීකරු වීම.

**06. ඔවුන් සිහිකරන්න - හෙබ්‍රෙව් 13:7**
මීට පෙර සිටිය නායකයන් හා ඔවුන් කළ සේවය සිහි කිරීම. ඔවුන්ගේ ආදර්ශය අනුගමනය කරන්න. එමෙන්ම වත්මන් නායකයන්ගේ සේවය පිළිබඳ හා ඔවුන් පවුල් උදෙසා යාච්ඤා කිරීම.

**07. ඔවුන්ට ආචාර කරන්න - හෙබ්‍රෙව් 13:24**
ඔවුන් ධෛර්ය කිරීම, ඔවුන් ගන්න තීරණවලට සහයෝගය දැක්වීම.

## සභා නායකයන්ගේ සේවය

01. රැළට ආදර්ශයක් වන්න - **1 පේත්‍රුස් 5:3**

02. රැළ රැකබලා ගන්න - **1 පේත්‍රුස් 5:3**

03. රැළ පෝෂණය කරන්න - **යොහාන් 21:17**

04. රැළ පාලනය කරන්න - **යොහාන් 21:16**

05. රැළ උදෙසා යාච්ඤා කරන්න - **යාකොබ් 5:14**

06. රැළ ප්‍රවේසම් කරන්න - **ක්‍රියා 20:28**

07. රැළට වචන උගන්වන්න - **හෙබ්‍රෙව් 13:7**
(වචනය කියා දුන්නාවූ.......)

08. රැළ උදෙසා වෙහෙසෙන්න - **1 තෙසලෝනික 5:12**
(නුඹලා අතරෙහි වෙහෙසෙන්නාවූ........)

09. රැළට දැනමුතුකම් දෙන්න - **1 තෙසලෝනික 5:12**
(නුඹලාට දැනමුතුකම් දෙන්නාවූ .......)

10. රැළට නායකත්වය දෙන්න - **ක්‍රියා 20:28**
(ශුද්ධාත්මයාණන් විසින් යම් රැළෙක් හි නුඹලා නායකයන් කොට නියම කල.....)

11. රැළ ගැන ගණන් දෙන්නෙකු බවට පත් වන්න - **හෙබ්‍රෙව් 13:17**

12. රැළට යහපත් එඬේරකු වන්න - **යොහාන් 10:14**
(රැළ උදෙසා ජීවිතය දීම නොහොත් සභාව උදෙසා ටික ටික ජීවිතය දිය කර හැරීම)

**"නුඹලා අතරෙහි සිටින දෙවියන් වහන්සේගේ රැළ බලාගනිමින්, බලහත්කාරය නිසා නොව දේව කැමැත්ත ලෙස සතුටු සිතින්ද, නින්දිත ලාභය නිසා නොව මනාප සිතකින්ද, නුඹලාගේ භාරයට දෙන ලද්දවුන් කෙරෙහි අධිපතිකම්කරන්නාක්මෙන් නොව නුඹලාම රැළට ආදර්ශව සිටිමින්ද එය රැකබලාගන්න" (1 පේත්‍රුස් 5:2-3).**

**- එස්. මෙත්තානන්ද -**

# ඊශ්‍රායෙල්වරුන්ගේ පළමු රජු

බයිබලයේ එන රජවරු පිළිබඳ තෙවැනි ලිපියෙන් අප අද හමුවන්නේ ඊශ්‍රායෙල්වරුන්ගේ ප්‍රථම රජු ලෙස පත්වූ කීෂ්ගේ පුත්‍රවූ සාවුල්ය. ඵාරාවෝගේ වහල් බැම්මෙහි පුරා වසර හාරසිය තිහක් හිරවී සිට මෝසෙස් කරණකොට ගෙන එයින් නිදහස්ව පොරොන්දු දේශයට (ඊශ්‍රායෙලයට) ප්‍රවාසිවූ දේව ජනතාව එතැන් පටන් පාලනය කරණු ලැබුවේ විනිශ්චයකාරයන් විසිනුයි. විනිශ්චයකරු වශයෙන් යෝෂුවාගේ සිට සාමුවෙල්ද ඔහුගේ පුත්‍රයන්වූ යෝවෙල් හා අබියාද දක්වා ක්‍රියා කළහ. සම්සොන්, ගිඩියොන්, බාරාක්, යෙප්තා, ෂම්ගර් වැනි විනිශ්චයකරුවෝ කීර්තිමත් අයවලුන් වූහ. එහෙත් සාමුවෙල්ගේ පුත්‍රයෝ දෙදෙනාගේ පක්ෂවාදී විනිශ්චයන් නිසා ඔව්හු යුක්තිය පසිඳලීමේදී ඊශ්‍රායෙල් ජනතාවගේ පිළිකුලට පාත්‍රවූහ. **(1 සාමුවෙල් 8:1-6)** මේ වනතුරු රජ කෙනකුගේ පාලන රටාව ඊශ්‍රායෙල්වරුනට අහිමිවූ නමුත් ඔව්හු රජ කෙනෙකකු ඉල්ලා සාමුවෙල්ට කරදර කළහ. මෙහි ප්‍රතිඵලය වූයේ දෙවියන්වහන්සේ විසින් කීෂ්ගේ පුත්‍රවූ සාවුල් නම් ධනවත් ශෝභමාන තරුණයා රජකමට පත් කිරීමය. **1 සාමුවෙල් 9:1 සිට 10:27** දක්වා මේ බැව් සඳහන්වේ. සාවුල් පිට තෙල් ආලේපකොට ඔහු රජකමට පත් කලේ සාමුවෙල් විසිනි. **(1 සාමුවෙල් 10:6** දැක්වෙන පරිදි සාවුල් දේවාත්මයෙන් පූර්ණව ධර්මවාක්‍යයද පැවසූ බව අප දිනිමු.) සාවුල් රජවූයේ ඔහුට යාන්තම් තිස්විය එළඹෙන විටදීය. **(1 සාමුවෙල් 13:1)**

## හිතුවක්කාරකම

සාවුල් ඉතා බලසම්පන්නවුත් එඩිතර වුත් රජෙකි. එසේම අම්මොන්වරුන් පිළිස්තිවරුන් ආදී සතුරු සේනාවන් පහසුවෙන් දිග්විජය කළ රණශූරයෙකි. එහෙත් සාවුල්ගේ රජකම ස්වාමීන්වහන්සේගේ හස්තයෙහි ස්ථිර වූයේ නැත. ඔහුගේ හදිසි කෝපය හා ඉක්මන්කම මෙන්ම වස්තු තෘෂ්ණාවද සාවුල් රජුගේ අනාගත අභිවෘද්ධිය විනාශකර දැම්මේය. ඔහු වරක් ගිල්ගාල් නම් ස්ථානයේ සිටියේය. එහෙත් සාමුවෙල්ගේ පැමිණීම පමාවනු දුටු ඔහුගේ කෝපය හා ඉක්මන්කාර ස්වභාවය නිසාම තමා විසින්ම දවන පූජාව ඔප්පුකරමින් පූජකයාගේ මෙහෙය තමාගේ අතට ගත්තේය. ඔහු රජෙක් මිස පූජකයෙක් නොවීය. පූජාව පුදා නිමවූ තැන සාමුවෙල් පැමිණියේය. සාවුල් පෙරමගට ගොස් ඔහුට ආචාර කළේය. එහෙත් සාමුවෙල්ගේ වචන මෙසේවිය, **"නුඹ අණුවන ලෙස ආඥාව නුඹ රක්ෂාකළේ නැත. රක්ෂාකලානම් ස්වාමීන්වහන්සේ නුඹේ රජකම ස්ථිර කරනවා ඇත. නුමුත් දැන් නුඹේ රජකම් පවතින්නේ නැත. ස්වාමීන්වහන්සේ නුඹට අණකළදේ නුඹ රක්ෂා නොකළ බැවින් උන්වහන්සේ තමාගේ සිතට එකඟවූ මනුෂ්‍යයෙකු සොයාගෙන තමන්ගේ සෙනඟ කෙරෙහි අධිපතියා වෙන්ට ඔහු නියමකර තිබේ" (ක්‍රියා 13:22 බලන්න)**. මෙහිදී අප විසින්ද සිහි තබාගතයුතු ආත්මීය ප්‍රතිපත්තිය වන්නේ **"දෙවියන්වහන්සේගේ සිතට එකඟවූ"** අයවලුන් මිස ප්‍රසිද්ධිය හෝ

ධනවත්කම හෝ උගත්කම ඇත්තාවූ අයවලුන් දෙවියන්වහන්සේ උසස් නොකරන බවය. දේව සේවයට ඇත්තාවූ මූලික සුදුසුකම වන්නේද යටහත්වීමෙන් දෙවියන්වහන්සේගේ කැමැත්ත කරමින් උන්වහන්සේගේ සිතට එකඟව සිටීමය. සාවුල් මීට අපොහොසත් විය. පිලිස්තිවරුන් ඔහු සමඟ නිරන්තර සටනට එළඹ ගත්හ. ඇතැම් අවස්ථාවලදී සාවුල් තමාගේ කීර්තිමත් පුත්‍රයාවූ යොනාතන් නිසා ජයගත් නමුත් සටන් නිමවූයේ නැත. දෙවියන්වහන්සේ මේ වන විට රජකම සඳහා වෙනත් දුප්පත් තරුණයෙක් තෝරාගෙන සිටි බැවින් සාවුල් කෙරෙහි උන්වහන්සේගේ අනුග්‍රහයක් නොවූ අතරම සාවුල්ද තමාගේ වරද කියාදී දේවකමාව ඉල්ලුවේ නම් තත්වය මීට වෙනස් වන්නට ඉඩ තිබිණ. කෙසේ වෙතත් සාවුල් තවත් බලවත් වරදක් කරමින් දෙවියන්වහන්සේට විරුද්ධව පව්කලෙන් ඔහුගේ එපා කරණු ලැබීම ස්ථිරවිය. එය සිදුවූයේ මෙසේය. **(1 සාමුවෙල් 13:8-23 දක්වාද 15:1-35** දක්වාද ඔබම කියවා බැලීම වටිනේය).

## රජකම පහවෙයි !

ස්වාමීන්වහන්සේ සාවුල් වෙත පණිවුඩයක් යැවුසේක. පණිවුඩකරුවා සාමුවෙල්ය. පණිවුඩයේ අමලෙක්වරුන්ට විරුද්ධව සටන් කොට මුළුමනින්ම ඔවුන් විනාශකරදමා ඔවුන් සතු සියල්ල නාස්තිකර දමන ලෙසය. ගවයන්, කොටළුවන්, බැටළුවන් ආදී කිසිවක්ම ඉතිරිකර නොගන්නා ලෙසද ස්වාමීන්වහන්සේ අණකළ සේක. සාවුල් අමලෙක්වරුන්ගේ නුවරට පැමිණ සැඟවී සිටියේය. දෙලක්ෂ දසදහසක් වූ පාබල හමුදාව හා යුද සෙනග සමග සාවුල් හවිලා දේශයේ සිට ෂූර් දේශය දක්වා බලවත් පහරදීමකින් අමලෙක්වරුන් විනාශ කර දැමීය. අමලෙක් රජවූ ආගග් පිවග්‍රහයෙන් අල්ලාගත් සාවුල් ඉතා හොඳ වූ ගවයන් හා බැටළුවන් ඉතිරිකරගෙන නුසුදුසු නොවටිනා සියලු සත්වයන් විනාශකර දැමුවේය. **(1 සාමුවෙල් 15:9)** මෙහිදි ස්වාමීන්වහන්සේගේ නියෝගය මුලුමණින්ම ක්‍රියාත්මක කිරීමට සාවුල් අපොහොසත් වූයේ තරවූ ගවයන් හා බැටළුවන් කෙරෙහි (භූමික වස්තූන් කෙරෙහි) තිබූ නොමැඩී ආශාවය. ස්වාමීන්වහන්සේ දෙවනවර ඔහු එපාකළ සේක. ඔබත් මමත් දේව නියෝගය දෙවැනි කොට මිනිස් සිතේ ආශාවට මුල්තැන දෙන ඔබත්, මමත් දේව නියෝගය දෙවැනි කොට මිනිස් සිතේ ආශාවට මුල්තැන දෙන විටත් සිදුවන්නේ දේව කරුණාව අහිමිවීමය. **"සාවුල් මගේ වචනය ඉෂ්ඨ නොකර මා අනුව යාමෙන් අහක්ව ගියේය'යි ස්වාමීන්වහන්සේ කීසේක" (සාමුවෙල් 15:11).**

සාමුවෙල් මේ පිළිබඳව ප්‍රශ්ණ කළ විට සාවුල්ගේ උත්තරයවූයේ කුමක්ද? **"නුඹ සියල්ල විනාශ කළේ නම් මගේ කන්වලට ඇසෙන බැටළුවන් හා ගවයන්ගේ හඬක් කුමක්ද?"** ප්‍රශ්ණය එයයි. පිළිතුර මෙයයි. **"මම ස්වාමීන්වහන්සේ හඬට කීකරුව, ස්වාමීන්වහන්සේ මා යැවූ ගමන ගොස් අමලෙක්වරුන්ගේ රජවූ ආගග් ගෙනාවෙමි. අමලෙක්වරුන්ද සහමුලින්ම විනාශකර දැම්මි. නමුත් සෙනග වනාහි විනාශයට කැපවූ දේවලින් ප්‍රධාන කොට්ඨාශය වන බැටළුවන්ද ගවයන්ද කොල්ලය අතරෙන් රැගෙන ගිල්ගාල්හිදී ඔබගේ දෙවිවූ ස්වාමීන්වහන්සේට පූජාකරණ පිණිස ආවෝය, සාමුවෙල් යලිත් දෙන අවවාදය අප සැමට**

**යෝග්‍යය. ස්වාමීන්වහන්සේගේ හඬට කීකරුවීම පමණ දවන පූජාවලටත් යාග පූජාවලටත් ප්‍රසන්නවන සේක්ද? පූජාවට වඩා කීකරු වීමත් බැටළුවන්ගේ තෙලට වඩා ඇහුම්කන්දිමත් හොඳය. මක්නිසාද කැරළිකාරකම ජේන කීමේ පාපයටත්, මුරණ්ඩුකම දේවතාවන් හා රූප ඇදහීමේ පාපයටත් සමානය. නුඹ ස්වාමීන්වහන්සේගේ වචනය පහකළ නිසා ස්වාමීන්වහන්සේත් නුඹෙන් රජකම පහකළසේකැයි"** කීවේය. **(1 සාමුවෙල් 15:22-23).**

## සාවුල්ගේ වැටීම

සාවුල්ගේ රජකම අතරේම සාමුවෙල් බෙත්ලෙහෙමට ගොස් දාවිත් රජකමට ආලේප කරණ ලදී. කෙසේ වෙතත් සාවුල්ගේ මුළු ජීවිත කාලයේදී ඔහුට විරුද්ධව යුද්ධ අඩුවූයේ නැත. සාමුවෙල්ද තමාගේ මරණය දක්වාම තවත් සාවුල් සම්මුඛ නොවූ බව **1 සාමුවෙල් 15:15** දැක්වේ. පිලිස්තිවරුන්ගේ යෝධයෙක්වූ ගාත්හි ගොලියත් නැගිට ඊශ්‍රායෙල් ජනතාවට දොස් කියමින් ඔවුන්ට සරදම් කරන්නට විය. මේ කාලයේදීද සාවුල්ගේ අපකීර්තිය වැඩි විය. ඔහු හෝ ඔහුගේ පළපුරුධු සේනාංක ගොලියත් ජයගත් පසු සාවුල් විසින් දාවිත්ට සිය පොරොන්දු ඉටු කළේද නැත. දාවිත් මරන්නට සෙවූ ඔහුව, දාවිත් විසින් දෙවරක්ම මරණයෙන් ගලවා ගැනීමෙන්ම දාවිත්ගේ යහපත් බව කදිමට සනාථවෙයි. එහෙත් සාවුල්ගේ පුත්‍රවූ යොනාතන් දාවිත්ගේ හිතේෂි මිත්‍රයා විය. සාවුල් විසින් දාවිත් මරන්ට සෙවූ සෑම විටෙකම දාවිත් ගැළවුණේ දෙවියන්වහන්සේ ඔහු සමඟ වූ නිසාමය. සාමුවෙල්ගේම වචනයෙන් ඔහු දරණ සාක්ෂියක් මෙසේය. **"මම තද අමාරුවට පත්ව සිටිමි. පිළිස්තිවරු මට විරුද්ධව යුද්ධ කෙරෙති. දෙවියන්වහන්සේ මා කෙරෙන් අහක්ව ගියසේක" (1 සාමුවෙල් 28:15).**

## සාවුල්ගේ මරණය

සාවුල් විසින් කරණු ලැබූ තවත් භයානක පාපයක් විය. ඔහු එන්දොර් නම් ස්ථානයට වෙස්වලාගෙන ගොස් ආත්ම බන්ධනකාර කතකගෙන් අංජනමක් බැලුවේය. ඔහු ආත්මබන්ධනකාරයන් හා අනවිනකාරයන්ද දේශයෙන් පහකර තිබූ නමුත් පසුව තෙමේම එම දුර්වලකමට වැටුණේය. **ලෙවිකතාව 20:21** අනුව දේව ජනතාව අංජනම්, නිමිත්, සාස්ත්‍ර, මන්ත්‍ර හදි හූනියම් සුභ මොහොත ප්‍රතික්ෂේප කරති. කිතුණුවන්වූ සියලු පරිසිවරුද තමන් පාවිච්චි කළ මන්ත්‍ර ගුරුකම් පොත් පුලුස්සා විනාශකර දැමූ අයුරුත් ඒවායේ වටිනාකම දරික් මිල 50,000ක් බවත් **ක්‍රියා 19:19** දැක්වේ. සාවුල් පිළිබඳව බොහෝදේ කතා කළ හැකිවුවද, ඔහුගේ මරණය සිදුවූ ආකාරය දැක්වීමෙන් මෙම ලිපිය නිම වෙයි. ගිලිබෝවාහිදී පිලිස්තිවරුන්ගේ දැඩි ප්‍රහාරයට ලක්වූ ඊශ්‍රායෙල්වරු කන්දේදී මැරී වැටුණෝය. සාවුල් පුත්‍රයන්වූ යොනාතාන්, අබිනාදාබ් හා මලිකි-ෂුවාද මරණු ලැබීය. සාවුල් තමාගේම කඩුව සිටුවා ඊපිට වැටී **(1 සාමුවෙල් 31)** දඟලමින් සිටින අතර අමලෙක් මනුෂ්‍යයෙක් ඔහු මැරුවේය. **(2 සාමුවෙල් 1:9-10)** සාවුල් හතලිස් වසරක් ඊශ්‍රායෙල්ගේ රජු ලෙස සිටියේය.

**- ප්‍රැන්සිස් විජයසිංහ -**

# ධාවන ශූරයින් තිදෙනෙක්

**"නුඹේ ප්‍රාණය ගලවා ගන්න දුවපන්න. ආපසු නොබලන්න. සම භූමියේ කොතැනකවත් නැවතී නොසිටින්න" (උත්පත්ති 19:17).**

**"කොඩියක් සියෝන් දෙසට නගාපල්ලා. ගැලවෙන පිණිස නොනැවතී දුවපල්ලා. මක්නිසාද මම උතුරෙන් විපත්තියක්ද මහත් විනාශයක්ද පමුණුවන්නෙමි" (යෙරමියා 4:6).**

ඉහත සඳහන් දෙපද ශුද්ධවූ බයිබලයෙන් උපුටා ගතිමි. දේව වචනය තුල දිවීම පිළිබඳ බොහෝ අවස්ථාවන්හී කථා කරයි. දෙවියන්වහන්සේද බොහෝ අවස්ථාවල දිවීම පිළිබඳ කතා කළ සේක. යම් යම් අවස්ථාවන්හී දුවපු තිදෙනෙකු පිළිබඳ දැන් අපි බලමු.

**2 සාමුවෙල් 18:22** පරිච්ඡේදය තුල සඳහන් අබ්සලොම්ගේ මරණය දාවිත් රජුට සැලකිරීමට යෝවාබ් විසින් තම සේවකයකු වන කූෂියා නැමැත්තෙකු යැවූ කල ඔහු පසු පස දුවන්නට යොවාබ්ගෙන් අවසර පැතූ අහිමයාශ්ගෙන් වර්තමානයේ කිතුණු ලෝකේ බොහෝ කිතුණුවන්ව ඉතා අපූරුවට පෙන්වයි. ඇයි මා එසේ කියන්නේ? මා එසේ කියන්නේ අහිමයාශ් කූෂියා පසු පස දුවන්න යෝවබ්ගෙන් අවසර පැතූ මොහොතේ බලන්න යෝවාබ් අහිමයාශ්ට කිදේ. අහිමයාශ් නැවතත් යෝවාබ්ට කථාකොට : කොහොම නමුත් මටත් කූෂියා පස්සේ දුවන්න අවසර දුන මැනවයි කීවේය. යෝවාබ්ද **"මාගේ පුත්‍රය, නුඹට සෑහෙන ආරංචි නැතිකොට දුවන්නේ මක්නිසාදැයි ඇසුවේය. එහෙත් ඔහු මක් වෙතත් දුවමියි කීවේය. ඔහුද දුවපන්නැයි ඔහුට කීවේය" (2 සාමුවෙල් 18:22).** මෙය කියවන අපට අහිමයාශ්ගේ දිවීම අරමුණ රහිත දිවීමක් බැව් අපට පෙණේ. අදද බොහෝ කිතුණුවන් තමාගේ දිවීමෙහි ප්‍රධාන අරමුණ අමතක කර දුවයි. සැබවින්ම මෙය ඔවුනට ඉතාමත් අනතුරුදායක වේ. මන්ද තමා දුවන්නේ කොතැන සිට කොතැනටද කුමක් අරඹයාද යන්න හරි හැටි අවබෝධයක් තිබිය යුතුමය. නැතහොත් එබඳුවකුගේ දිවීමේ ප්‍රතිඵලය බිංදුවකි. කෙනෙකුගේ බල කිරීමට වත් අන් අය සතුටු කිරීම පිණිසවත් දිවීමෙන් වලකින්න. **"මා මනුෂ්‍යයන් ප්‍රසන්න කරන්න සොයනවාද? මම තවම මනුෂ්‍යයන් ප්‍රසන්න කරම් නම් ක්‍රිස්තුස්වහන්සේගේ දාසයෙකු නොවෙමි" (ගලාති 1:10).**

ඔබගේ ජීවිත ගමනේ අරමුණ හොඳින් හඳුනා ගන්න. නිෂ්ඵල ලෙස දුවන්නෙකු නොවන්න. දෙවියන්වහන්සේ ප්‍රසන්න කිරීම උදෙසා වැඩ කරන්නෙකු වන්න.

**(2 රාජාවලිය 5:20)**

ඉහත පරිච්ඡේදය තුල අපට තවත් දුවන්නෙකු පිළිබඳ කථා කරයි. ඔහුද දේව වචනය තුල තවත් එක් සුවිශේෂී චරිතයකි. ඔහු ශ්‍රේෂ්ඨ දේව දාසයෙකු වූ එලීෂාගේ සේවක ගෙහාසිය. ඉතා දරුණු කුෂ්ඨයකින් පීඩා ලත් සිරියේ රජුගේ සෙන්පති වන නාමන්ගේ රෝගයෙන් එලීෂාගේ අවවාද මත සුවය ලද මොහොතේ නාමන්ගෙන් එලීසා ලද මුත් එපා කරන ලද ඇඳුම් කුට්ටම් සහ රිදී තමාට අයිති කර ගැනීමේ මහත් කෑදර කමකින් මඩිනු ලැබ නාමන්ගේ අශ්වකරත්තය පසු පස දිව ගිය බව දේව වචනය අපට නොසගවා පවසයි. **"බලව මාගේ ස්වාමියා මේ සිරියවූ නාමන්ගෙනා දේවල් ඔහුගේ අතින් පිළිගනො ගෙන නිකම්ම හැරී ගියේය. ස්වාමින්වහන්සේ ජීවමාන බව සැබෑවා සේම මම ඔහු පස්සේ දිව ගොස් ඔහුගෙන් මොකවත් ලබා ගනිමියි කිවේය".** බලන්න ඔහුගේ දිවීම කුමක් අරඹයාද කියා, එලීසා **(2 රාජාවලිය 5:20)** එපා කල රිදී සහ ඇඳුම් කුට්ටම් තමාට ලබා ගැනීමේ පටු ආශාව විසින් ඔහුව පෙලන ලද්දේය. කිතුණු ගමනේදී ඇස් වලට පෙනෙනා ලෝකේ ඇති බොහෝ දේ අප සිත් තුල ආශා ඇති කරයි. ගෙහාසිටද වූයේ එවැන්නකි. තම ස්වාමියා ප්‍රතික්ෂේප කළ දේ තමාට ගැනීමේ තද ආශාවක් ඇති මාංශික තෘෂ්ණා වලට වැටී නාමන්ගේ අශ්ව කරත්තය පසු පස ගියේය. වත්මන් බොහෝ කිතුණුවෝද මිල මුදල් පසු පස දුව යමින් ඊට ලොල් බැඳ කිතුණු ගමනේ සැබෑ අරමුණ අමතක කරයි. එබඳු දිවීමක් තුල කිසිඳු මොහොතක අප ලබන ජයක් නැත. ඇත්තේ ශෝකය සහ වෙහෙස පමණි. අපද තෑගි බෝග පසු පස ගිය ගෙහාසි



මෙන් නොවෙමු. **"ඇති දෙයින් සතුටු වී වස්තු තෘෂ්ණාවෙන් තොරව සිටපල්ලා" (හෙබ්‍රෙව් 13:5).** යාකොබ් තුමා කී ඒ රන් අවවාද සිතේ ධාරනය කර ගැනීමට අප ප්‍රමාද නොවෙමු. ගෙහාසිගේ ගති ලක්ෂණ ඔබ කෙරෙන් ඉවතලා කිතුණුවෙකු දිවිය යුතුවූ ඒ අරමුණ හඳුනාගෙන ඒ පිණිස දුවන්න සිතට ගැනීම වැදගත්ය. මන්ද ඔබට සදාකාල ජීවන මිල මුදල්වලට ගත නොහැකිය. වස්තුව

පිළිබඳ සැබෑ විවරණයක් **(යාකොබ් 5:1-4)** සඳහන්ව තිබේ. තවද ගෙහාසි නාමන් ළඟට දුවගොස් ගත් තෑගි බෝග සියල්ල ඔහු තුල රැඳුනේ ඉතා සුලු වේලාවකි. ඉන්පසු ගෙහාසිට උරුම වූයේ නාමන්ගෙන් ඉවත්ව ගිය වේදනාකාරී කුෂ්ඨයය. **2 රාජාවලිය 5:25-27** දක්වා බලන්න. පාපය නම් කුෂ්ඨයට හිමි කරුවෙකු නොවන්න.

**1 කොරින්ති 9:24 - 27**

අප දැන් අවසාන වශයෙන් දේව වචනය තුළ හමු වන තවත් එක් සුවිශේෂී ධාවන ශූරයෙකු දෙසට හැරෙමු. **"දුවන ස්ථානයේ සියල්ලන්ම දුවන නමුත් තෑග්ග ලබන්නේ එක්කෙනෙක්ම බව නොදනිමුද? එසේම නුඹලාත් ලබා ගන්නා පිණිස දුවපල්ලා. දිනන පිණිස වීර්‍ය කරන්නාවූ සියල්ලෝම සියල්ලෙහි පමණ දැන හැසිරෙති. ඔවුන් එසේ කරන්නේ දිරන්නාවූ ඔටුන්නක් ලබන පිණිසය. අප වනාහී නොදිරන එකක් ලබන පිණිසය" (1 කොරින්ති 9:24).** ක්‍රීඩකයෙකුගේ එකම අභිලාශය වන්නේ කෙසේ හෝ ජයග්‍රහනය කිරීමය. ධාවන කරුවෙකු නම් සිය ධාවන පථයෙදී ධාවනය ඇරඹූ තැන් පටන් ගමනාන්තය තෙක් සාර්ථකව ධාවනයක යෙදීමය. ශුද්ධවර පාවුල් තුමා කී ප්‍රකාරයට මේ ධාවනය සිදු කරන්නේ නොදිරනසුලු කිරුළක් ලැබීමටය. එසේම නුඹලාත් ලබාග න්නා පිණිස දුවපල්ලා යයි **1 කොරින්ති 9:25** අපට අවවාද කෙරේ. අප සැබවින්ම දිවිය යුත්තේ ඒ කිරුල පසු පස මිස මිල මුදල් තෑගි බෝග පසු නොවන බව ඔහු අපට දන්වයි.

මා දැනට ලබාගෙන සිටිනවා වත්, මා දැනටම සම්පූර්ණ වී සිටිනවාවත් නොවේ. නමුත් යමක් පිණිස ක්‍රිස්තුස්වහන්සේ මා අල්ලාගත් සේක්ද ඒක අල්ලා ගන්න වීර්ය කරමින් මමත් දුවගෙන යමි. **(පිලිප්පි 3:12).** ඉහත සඳහන් අභිමායාශ් නම් තැනැත්තා ලෙස නිෂ්ඵලව දිවීමවත් ගෙහාසි මෙන් තෑගි බෝග මිල මුදල් පසු පස නොදුවමින් ශුද්ධවර පාවුල් මෙන් ඒ නොදිරන සුලු ස්වර්ගි ක ඔටුන්න ලබන පිණිසම දුවන්නට අප අප සිතට ගනිමු. කිසිදු දෙයකට ඔබට හිමි ඒ ස්වර්ගික ඔටුන්න නොග න්නා ලෙස නුඹට තිබෙනා දේ තදින් අල්ලා ගන්න **(එළිදරව් 3:11).** ඔබට යේසු සමිදාණන්ගේ පිහිටයි!

**- මැතිව් ප්‍රියංකර ෆොන්සේකා -**

# අප මධ්‍යස්ථානයේ පැවැත්වෙන රැස්වීම්.

## ඉරිදා

| | | |
|---|---|---|
| පෙ.ව 8.15 - 9.15 | - | ඉරිදා පාසැල<br>අවුරුදු 3-18 දක්වා ළමුන් සඳහා |
| පෙ.ව 9.30 - 12.00 | - | රොටි කැඩීමේ හා නමස්කාර රැස්වීම<br>(සිංහල , දෙමළ , ඉංග්‍රීසි) |
| ප.ව 4.00 - 5.00 | - | සුභාරංචි රැස්වීම - (සිංහල) |
| ප.ව. 6.00 - 7.00 | - | සුභාරංචි රැස්වීම - (ඉංග්‍රීසි) |

## අඟහරුවාදා

| | | |
|---|---|---|
| ප.ව 6.30 - 7.30 | - | සුභාරංචි රැස්වීම<br>(දෙමළ) |

## බදාදා

| | | |
|---|---|---|
| ප.ව 6.00 - 7.30 | - | යාච්ඤා රැස්වීම<br>අසනීප අය සඳහා තෙල් ආලේප කර යාච්ඤා කිරීම |

## සිකුරාදා

| | | |
|---|---|---|
| ප.ව 6.00 - 7.30 | - | බයිබල් අධ්‍යයනය |


**ක්‍රිස්තියානි සහෝදර මධ්‍යස්ථානය**

අංක - 07, විවේකානන්ද පාර,
වැල්ලවත්ත,
කොළඹ 06.
දුරකථන අංක : 011 2 581 901 / 077 8 813 197
www.christianfellowshipcentre.com



NMA GRAPHICS
No. 246/ , Galle Road, Ratmalana.
Tel: 011 2 730 644 / 071 4 286 295 / 077 4 223 020
E-mail : nmagraphics2001@gmail.com